Joint Statement between the People’s Republic of China and The Democratic Socialist Republic of Sri Lanka

mfa.gov.lk/en/joint-statement-between-china-sri-lanka/

Beijing, January 16, 2025

1. At the invitation of H.E. Xi Jinping, President of the People's Republic of China, H.E. Anura Kumara Disanayaka, President of the Democratic Socialist Republic of Sri Lanka, paid a state visit to the People's Republic of China from January 14 to 17, 2025.

2. During the visit, President Anura Kumara Disanayaka held talks with President Xi Jinping, and met with H.E. Li Qiang, Premier of the State Council and H.E. Zhao Leji, Chairman of the Standing Committee of the National People's Congress. In a cordial and friendly atmosphere, the two sides had in-depth exchanges of views and reached extensive common understandings on deepening traditional friendship and advancing high-quality Belt and Road cooperation and multi-sectoral practical cooperation between China and Sri Lanka, and on regional and international issues of mutual interest.

3. The two sides share the view that China and Sri Lanka have consistently respected each other, treated each other as equals and stood by each other over the 68 years of diplomatic ties, and set a fine example of friendly interactions and mutually beneficial cooperation between countries of different sizes. The two sides agreed to carry forward the spirit of independence, self-reliance, solidarity and mutual assistance enshrined in the Rubber-Rice Pact, follow the principles of mutual respect, mutual trust, mutual support, win-win cooperation and common development, stay committed to deepening the China-Sri Lanka strategic cooperative partnership based on sincere mutual assistance and ever-lasting friendship, and jointly build a China-Sri Lanka community with a shared future, to bring greater benefits to the two countries and peoples.

4. The two sides agreed to maintain the momentum of close high-level exchanges to keep the strong strategic guidance by the leaders of the two countries over bilateral relations, to further strengthen bilateral exchanges between the two governments, legislative bodies and political parties to consolidate political mutual trust and share and learn from each other's governance and development experience, and make dedicated efforts to enhance China-Sri Lanka relations.

5. Both sides reaffirmed mutual support on issues involving each other's core interests and major concerns. Both sides reaffirm the authority of the United Nations General Assembly Resolution 2758 and Sri Lanka reaffirmed its strong commitment to the one-China principle, recognizing that the Government of the People's Republic of China is the sole legal government representing the whole of China, and Taiwan is an inalienable part of China's territory. Sri Lanka firmly supports all efforts by the Chinese government to achieve national reunification, and opposes "Taiwan independence" in any form. Sri Lanka reiterated that it will never allow its territory to be used for any anti-China, separatist activities and will firmly support China on issues related to Xizang and Xinjiang. China reiterated that it will continue to firmly support Sri Lanka in safeguarding national independence, sovereignty and territorial integrity, and will respect and support Sri Lanka in independently choosing a development path suited to its national conditions. The Chinese side reiterated its commitment to an independent foreign policy of peace. Sri Lanka reiterated its commitment to an independent non-aligned foreign policy.

6. China congratulated Sri Lanka on successfully holding presidential and parliamentary elections in 2024, expressed its good wishes for the new Sri Lankan government to take the Sri Lankan people forward in economic and social development, unity, stability and prosperity, and conveyed its readiness to provide active support as the Sri Lankan government works to promote the sustainable development of the country. Sri Lanka commended the remarkable achievements China made in the new era, and expressed support for China to build a great modern socialist country in all respects and advance the great rejuvenation of the Chinese nation through the Chinese path to modernization. Sri Lanka believes that China's drive to further deepen reform comprehensively and promote high-standard opening up will bring new opportunities for Sri Lanka's economic advancement.

7. Under the guidance and encouragement of leaders of both countries, China and Sri Lanka have produced fruitful outcomes in Belt and Road cooperation. Sri Lanka appreciates the important role of Belt and Road cooperation in its economic and social development and the livelihood of its people. The two sides agreed to advance all major signature projects including the Colombo Port City and Hambantota Port integrated development, fully utilize such platforms as the Silk Road Workshop and carry out more livelihood programs in Sri Lanka in accordance with the principles of planning together, building together and benefiting together, open, green and clean cooperation, and high-standard, people-centered and sustainable development and following the eight major steps announced by President Xi Jinping for supporting high-quality Belt and Road cooperation. The two sides were pleased to sign a Belt and Road cooperation plan to upgrade China-Sri Lanka high-quality Belt and Road cooperation and jointly open up new space for win-win development of higher standard, stronger resilience and greater sustainability.

8. Sri Lanka expressed its high appreciation for the valuable support it has received from China in times of financial difficulties, including the vital assistance in restructuring China-related debts, which was a robust support for Sri Lanka in effectively dealing with the debt issue. Sri Lanka expressed its desire for the early implementation of the agreed debt restructuring plan together with Chinese financial institutions. China will continue to play a positive role in the International Monetary Fund and maintain friendly communication with other creditors to help Sri Lanka ease its financial difficulties and achieve debt sustainability. The Central Bank of Sri Lanka and the People's Bank of China have renewed their currency swap agreement and will continue to carry out financial cooperation.

9. The two sides are satisfied with the progress of bilateral cooperation in economy and trade. Sri Lanka expressed appreciation to China for its effort to promote import from Sri Lanka through various means. China expressed its readiness to continue supporting Sri Lankan enterprises in the tea, gem and other industries in establishing ties with relevant Chinese associations of importers and exporters, facilitate Sri Lanka's participation in expos such as the China International Import Expo, China Import and Export Fair, China-South Asia Exposition and e-commerce platforms, and further enhance cooperation between enterprises of the two countries on the basis of mutual benefit and win-win outcomes. The two sides agreed to work toward the early conclusion of a comprehensive free trade agreement in one package in line with the principles of equality, mutual benefit and win-win outcomes.

Sri Lanka welcomes more business investment from China and will provide a conducive investment and business environment for this purpose. China will continue to encourage Chinese enterprises in investing in Sri Lanka to facilitate economic transformation and sustainable development in Sri Lanka. The two sides agreed to expand cooperation in such fields as logistics, green development, and digital economy to propel their high-quality and mutually beneficial practical cooperation.

10. The two sides shared positive evaluations of their wide-ranging cooperation and in-depth exchanges on agriculture. China conveyed its readiness to carry out training and demonstration programs with Sri Lanka in areas including bio-technologies for tropical crops, plant breeding and cultivation, and aquaculture to help Sri Lanka enhance its capacity for sustainable agricultural development; and welcome Sri Lanka to further expand its export of distinctive products to China, including tea, fruits, cinnamon, and aquatic products. The two sides shared the readiness to expand exchanges and cooperation with a sharper focus on poverty reduction and rural revitalization. China expressed its readiness to help Sri Lanka strengthen the capacity of personnel in related fields.

11. Both sides recognize climate change as one of the greatest challenges of human society and a threat to the sustainable development of developing countries including China and Sri Lanka. They agreed to work actively together on climate change. Sri Lanka expressed appreciation to China for its humanitarian relief in the wake of severe flooding. China expressed its readiness to enhance cooperation with Sri Lanka in such fields as disaster prevention and mitigation and emergency rescue, share its technologies and provide training in improving Sri Lanka's emergency management capabilities. China welcomes Sri Lanka's participation in the relevant activities of the Belt and Road International Green Development Coalition and other platforms as part of the joint effort to realize the U.N. 2030 Sustainable Development Goals.

12. The two sides share the desire to continue maritime cooperation on the basis of equality, mutual trust, openness and mutual benefit, and hold regular bilateral consultations on maritime affairs. The two sides are ready to deepen cooperation in such fields as conservation and restoration of the marine environment and ecosystems, maritime domain awareness, maritime rescue and disaster relief, and maritime personnel training and capacity building, and pool their strength to build a maritime community with a shared future. The two sides agreed to sign Memorandum of Understanding on Ocean Cooperation toward Blue Partnership.

13. The two sides are ready to deepen cooperation on education. The two sides fully recognized the importance of education exchanges for increasing understanding and friendship, and expressed readiness to further enhance exchanges of teachers, students, and researchers. China welcomes and encourages more committed students from Sri Lanka to pursue further studies in China, and is ready to continue to support them with government scholarships. China will work with Sri Lanka to implement the Luban Workshop to good effect and nurture more professionals through vocational and technical training for Sri Lanka. Sri Lanka appreciates China's assistance in education, and will work for the success of the digital classroom project together with China. The two sides are ready to promote Chinese language education in Sri Lanka and continue to work through the China Culture Center in Sri Lanka to promote cultural exchanges and cooperation between the two countries. The two sides will continue to work in and develop the China-Sri Lanka Joint Center for Education and Research under the Chinese Academy of Sciences, and strengthen scientific and technological exchanges and cooperation and education in the universities and research institutes of the two countries.

14. The two sides are ready to carry forward their long-standing friendship and bring their peoples closer together. The two sides will take multiple measures to encourage mutual tourist travel and aviation connectivity. China welcomes more Sri Lankan cities in the International Tourism Alliance of Silk Road Cities. The two sides will continue to support each other in holding tourism promotion activities in China and Sri Lanka.

15. The two sides are ready to strengthen exchanges and cooperation in areas such as youth, think tanks, sports, and the media, build on the bond of Buddhist exchanges, and deepen people-to-people and sister-city exchanges.

16. China will continue to extend support for the development of the health sector in Sri Lanka. China's Yunnan Province will continue to send medical teams to Sri Lanka to carry out the Brightness Action program.

17. The Chinese side commends Sri Lanka's positive response to President Xi Jinping's proposal of the Asian Initiative for Cultural Heritage Conservation and Sri Lanka's participation in the Alliance for Cultural Heritage in Asia. China will further promote bilateral cultural heritage cooperation with Sri Lanka under the Alliance.

18. The two sides recognize judicial, law enforcement and security cooperation as an important component of bilateral cooperation, and stand ready to jointly crack down on cross-border crimes such as telecom fraud and online gambling. China is ready to do its best to support capacity building in Sri Lanka's judicial, law enforcement and security areas and provide assistance of police supplies.

19. Sri Lanka reaffirmed its commitment to supporting and actively participating in the development of a community with a shared future for mankind, the Global Development Initiative, the Global Security Initiative and the Global Civilization Initiative proposed by President Xi Jinping. The year 2025 marks the 80th anniversary of the founding of the United Nations, which was just after the end of the Second World War. The two sides reaffirmed their commitment to jointly upholding the international system with the U.N. at its core, the international order underpinned by international law, and the basic norms governing international relations based on the purposes and principles of the U.N. Charter. The two sides will adhere to the Five Principles of Peaceful Coexistence and jointly advocate an equal and orderly multipolar world and a universally beneficial and inclusive economic globalization, and work toward a bright future of peace, security, prosperity and progress for all countries in the world.

20. During the visit, the two sides signed cooperation documents, in the areas of agriculture, tourism, livelihood assistance, the media and other areas.

21. President Anura Kumara Disanayaka expressed appreciation to the Chinese government and people for the warm hospitality extended to him and the Sri Lankan delegation, and invited the Chinese leadership to visit Sri Lanka. The Chinese leadership expressed appreciation for the kind invitation, and the two sides agreed to maintain communication via diplomatic channels.

මහජන චීන සමූහාණ්ඩුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය අතර ඒකාබද්ධ ප්‍රකාශය
බීජිං, 2025 ජනවාරි 16 වැනි දින

1. මහජන චීන සමූහාණ්ඩුවේ ජනාධිපති අතිගරු ෂී ජින් පිං මැතිතුමාගේ ආරාධනයෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා 2025 ජනවාරි 14 වැනි දින සිට 17 වැනි දා දක්වා මහජන චීන සමූහාණ්ඩුවේ රාජ්‍ය සංචාරයක නිරත විය.

2. සංචාරය අතරතුරදී, ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ජනාධිපති ෂී ජින් පිං මහතා සමඟ සාකච්ඡා පැවැත්වූ අතර, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අග්‍රාමාත්‍ය ලී චියන්ග් සහ ජාතික මහජන කොංග්‍රසයේ ස්ථාවර කමිටුවේ සභාපති ජාඕ ලෙජි යන මහත්වරුන් හමු විය. සුහද හා මිත්‍රශීලී වාතාවරණයක් තුළ, විස්තරාත්මක ලෙස අදහස් හුවමාරු කර ගත් දෙපාර්ශ්වය, චීනය සහ ශ්‍රී ලංකාව අතර සාම්ප්‍රදායික මිත්‍රත්වය වර්ධනය කිරීම, උසස් තත්ත්වයේ එක් තීරයක්- එක් මාවතක් සංකල්පය අරමුණු කරගත් සහයෝගිතාව, බහු-ආංශික ප්‍රායෝගික සහයෝගිතාව ඉදිරියට ගෙන යාම සහ අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන කලාපීය සහ ජාත්‍යන්තර කරුණු පිළිබඳ විස්තීර්ණ පොදු අවබෝධතාවනට එළැඹුණි.

3. චීනය සහ ශ්‍රී ලංකාව වසර 68ක රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තුළ නිරන්තරයෙන් එකිනෙකාට ගරු කරමින්, සමාන ලෙස සලකමින් සහ එකිනෙකා වෙනුවෙන් පෙනී සිටිමින්, භූමි ප්‍රමාණයෙන් වෙනස් වූ රටවල් අතර මිත්‍රශීලී අන්තර්ක්‍රියාවලට සහ අන්‍යෙන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලැබෙන සහයෝගිතාවට කදිම ආදර්ශයක් සපයා ඇති බව දෙපාර්ශ්වයේම අදහස විය. රබර්-සහල් ගිවිසුමේ අන්තර්ගත ස්වාධීනත්වය, ස්වයං විශ්වාසය, සහයෝගිතාව සහ අන්‍යෙන්‍ය සහයෝගය ඉදිරියටත් පවත්වාගෙන යෑමට, අන්‍යෙන්‍ය ගෞරවය, විශ්වාසය, සහයෝගය, දෙපාර්ශ්වයටම වාසිදායක සහයෝගිතාව සහ පොදු සංවර්ධනය යන මූලධර්ම අනුගමනය කිරීම, අවංක අන්‍යෙන්‍ය සහයෝගය සහ දිගුකාලීන මිත්‍රත්වය මත පදනම්ව චීන-ශ්‍රී ලංකා උපායමාර්ගික සහයෝගිතා හවුල්කාරිත්වය පුළුල් කිරීම පිණිස කැපවී සිටීමට සහ දෙරටට සහ දෙරටේ ජනතාවට වැඩි ප්‍රතිලාභ ගෙන ඒම සඳහා බෙදා හදා ගත් අනාගතයක් සහිත චීන-ශ්‍රී ලංකා ප්‍රජාවක් ඒකාබද්ධව ගොඩනැගීමට දෙපාර්ශ්වය එකඟ විය.

4. ද්විපාර්ශ්වික සබඳතා සම්බන්ධයෙන් දෙරටේ නායකයින්ගේ ශක්තිමත් උපායමාර්ගික මඟපෙන්වීම පවත්වා ගැනීම සඳහා සමීප ඉහළ මට්ටමේ සබඳතාවල ගම්‍යතාව පවත්වා ගැනීමටත්, දෙරටේ රජයන් අතර ද්විපාර්ශ්වික හුවමාරු තවදුරටත් ශක්තිමත් කිරීමටත්, ව්‍යවස්ථාදායක ආයතන සහ දේශපාලන පක්ෂ අතර ද්විපාර්ශ්වික හුවමාරු තවදුරටත් ශක්තිමත් කිරීමට සහ එකිනෙකාගේ පාලන හා සංවර්ධන අත්දැකීම් බෙදා ගැනීමට සහ ඒවායින් ඉගෙන ගැනීමටත්, චීන-ශ්‍රී ලංකා සබඳතා වැඩි දියුණු කිරීම සඳහා කැපවීමෙන් යුත් ප්‍රයත්න දැරීමටත් දෙපාර්ශ්වය එකඟ විය.

5. එකිනෙකාගේ ප්‍රධාන අභිලාෂ සහ විශාල වශයෙන් සැලකිල්ල දක්වන ගැටලුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් අන්‍යොන්‍ය වශයෙන් සහයෝගය දක්වන බව දෙපාර්ශ්වයම යළි තහවුරු කළේය. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල යෝජනා අංක 2758 හි අධිකාරි බලය දෙපාර්ශ්වයම නැවත තහවුරු කළ අතර, මහජන චීන සමූහාණ්ඩුවේ රජය සමස්ත චීනයම නියෝජනය කරන එකම නීත්‍යානුකූල රජය බවත්, තායිවානය චීනයේ භූමියෙන් වෙන් කළ නොහැකි කොටසක් බවත් පිළිගනිමින් එක් චීනයක් යන මූලධර්මය කෙරෙහි තමන් සතු දැඩි කැපවීම ශ්‍රී ලංකාව යළි තහවුරු කළේය. ජාතියක් වශයෙන් නැවත එක්සත් වීම සාක්ෂාත් කර ගැනීම සඳහා චීන රජය ගන්නා සියලු උත්සාහයන්ට ශ්‍රී ලංකාව දැඩි ලෙස සහය දක්වන අතර, කවර වූ හෝ සවරූපයක "තායිවානය ස්වාධීනත්වයට" විරුද්ධ වේ. චීන විරෝධී, බෙදුම්වාදී ක්‍රියාකාරකම් සඳහා තම භූමිය භාවිතා කිරීමට කිසි විටෙකත් ඉඩ නොදෙන බවත්, ෂිසන්ග් සහ ෂින්ජියැන්ග් පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් චීනයට ස්ථිර ලෙස සහය ලබා දෙන බවත් ශ්‍රී ලංකාව නැවත අවධාරණය කළේය. ජාතික නිදහස, ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවට ස්ථිර ලෙස සහය දෙන බවත්, එහි ජාතික තත්වයන්ට ගැලපෙන සංවර්ධන මාවතක් ස්වාධීනව තෝරා ගැනීමේදී ශ්‍රී ලංකාව ගනු ලබන තීරණවලට ගරු කරන බවත්, සහය දෙන බවත් චීනය නැවත අවධාරණය කළේය. ස්වාධීන සාම විදේශ ප්‍රතිපත්තියක් උදෙසා තමන් තුළ ඇති කැපවීම චීන පාර්ශ්වය යළි අවධාරණය කළේය. ස්වාධීන නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් උදෙසා තමන් තුළ ඇති කැපවීම ශ්‍රී ලංකා පාර්ශ්වය යළි අවධාරණය කළේය.

6. 2024දී ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය සාර්ථකව පැවැත්වීම පිළිබඳව ශ්‍රී ලංකාවට සුබ පැතූ චීනය ආර්ථික හා සමාජීය සංවර්ධනය, එකමුතුකම, ස්ථාවරත්වය සහ සමෘද්ධිය ඔස්සේ ශ්‍රී ලංකාවේ ජනතාව ඉදිරියට ගෙන යෑම පිණිස ශ්‍රී ලංකාවේ නව රජයට සිය සුබ පැතුම් එක් කළ අතර, ශ්‍රී ලංකා රජය රටේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරන විට ඒ සඳහා ක්‍රියාකාරී සහයෝගය ලබා දීමට තමන් සතු සූදානමද ප්‍රකාශ කළේය. නව යුගයේ චීනය ලබා ඇති විශිෂ්ට ජයග්‍රහණ ශ්‍රී ලංකාවේ ප්‍රශංසාවට ලක් වූ අතර, සෑම අතින්ම ශ්‍රේෂ්ඨ නවීන සමාජවාදී රටක් ගොඩනැගීමට සහ චීන නවීකරණයේ මාවත හරහා චීන ජාතියේ මහා පුනර්ජීවනය ඉදිරියට ගෙන යෑමට චීනයට සහය දක්වන බවද ශ්‍රී ලංකාව ප්‍රකාශ කළේය. ප්‍රතිසංස්කරණ පුළුල් කිරීමට සහ ඉහළ ප්‍රමිතියකින් යුත් විවෘතභාවය ප්‍රවර්ධනය කිරීමට චීනය ගන්නා උත්සාහය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා නව අවස්ථා උදා කරනු ඇතැයි ශ්‍රී ලංකාව විශ්වාස කරයි.

7. දෙරටේ නායකයින්ගේ මහ පෙන්වීම සහ දිරිගැන්වීම යටතේ, චීනය සහ ශ්‍රී ලංකාව එක් තීරයක් -එක් මාවතක් සහයෝගිතාවෙහි ඵලදායී ප්‍රතිඵල අත්කර ගෙන ඇත. සිය ආර්ථික හා සමාජීය සංවර්ධනය සහ ජනතාවගේ ජීවනෝපාය විෂයෙහි එක් තීරයක් -එක් මාවතක් සහයෝගිතාව ඉටුකරන වැදගත් කාර්යභාරය ශ්‍රී ලංකාව අගය කරයි. කොළඹ වරාය නගරය සහ හම්බන්තොට වරාය ඒකාබද්ධ සංවර්ධනය ඇතුළු සියලුම ප්‍රධාන ව්‍යාපෘති ඉදිරියට ගෙන යාමට, සේද මාවත වැඩමුළුව වැනි වැඩසටහන් සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට සහ එක්ව සැලසුම් කිරීමේ, ගොඩනැගීමේ සහ ප්‍රතිලාභ ලැබීමේ මූලධර්මවලට අනුකූලව ශ්‍රී ලංකාව තුළ තවත් ජීවනෝපාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට, විවෘත, හරිත හා පිරිසිදු සහයෝගිතාව සහ උසස් ප්‍රමිතියකින් යුත්, ජනතාව කේන්ද්‍ර කරගත් සහ තිරසර සංවර්ධන මූලධර්මවලට අනුකූලව, උසස් තත්ත්වයේ එක් තීරයක් -එක් මාවතක් සහයෝගිතාවයට සහය වීම සඳහා ජනාධිපති ෂී ජින් පිං මහතා විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රධාන පියවර අට අනුගමනය කිරීමට දෙපාර්ශ්වයම එකඟ විය. උසස් තත්ත්වයේ චීන-ශ්‍රී ලංකා එක් තීරයක් -එක් මාවතක් සහයෝගිතාව වැඩිදියුණු කිරීම සහ ඉහළ ප්‍රමිතියකින් යුත්, ශක්තිමත්, ඔරොත්තු දීමේ හැකියාවෙන් සහ වැඩි තිරසරභාවයකින් යුත් ජයග්‍රාහී සංවර්ධනය සඳහා ඒකාබද්ධව නව අවකාශයක් විවෘත කිරීම සඳහා එක් තීරයක් -එක් මාවතක් සහයෝගිතා සැලැස්මකට දෙපාර්ශ්වය අත්සන් තැබීය.
8. ණය ගැටලුව සමඟ ඵලදායී ලෙස කටයුතු කිරීමේදී ශ්‍රී ලංකාවට ශක්තිමත් සහයෝගයක්වූ, චීනය ආශ්‍රිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ලබාදුන් අත්‍යවශ්‍ය සහයද ඇතුළුව, මූල්‍ය දුෂ්කරතා ඇති වූ කාලවලදී චීනයෙන් ලැබුණු වටිනා සහයෝගයට ශ්‍රී ලංකාව සිය කෘතඥතාව පළ කළේය. එකඟ වූ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම චීන මූල්‍ය ආයතන සමඟ එක්ව ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව කැමැත්ත පළ කළේය. ශ්‍රී ලංකාවේ මූල්‍ය දුෂ්කරතා ලිහිල් කිරීමට සහ ණය තිරසරභාවය ළඟා කර ගැනීමට උපකාර කිරීම සඳහා චීනය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තුළ අඛණ්ඩවම ධනාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇති අතර අනෙකුත් ණයහිමියන් සමඟ මිත්‍රශීලී සන්නිවේදනයක් පවත්වා ගනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව සහ චීන මහජන බැංකුව ඔවුන්ගේ මුදල් හුවමාරු ගිවිසුම අලුත් කර ඇති අතර මූල්‍ය සහයෝගිතාව අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

9. ආර්ථිකයේ සහ වෙළෙඳාමේ ද්විපාර්ශ්වික සහයෝගිතාවෙහි ප්‍රගතිය පිළිබඳව දෙපාර්ශ්වයම සෑහීමකට පත්ව සිටියි. ශ්‍රී ලංකාවේ සිට කෙරෙන ආනයන ප්‍රවර්ධනය කිරීමට විවිධ මං ඔස්සේ චීනය දරන ප්‍රයත්නය පිළිබඳව ශ්‍රී ලංකාව සිය කෘතඥතාව පළ කළේය. චීන ආනයනකරුවන්ගේ සහ අපනයනකරුවන්ගේ අදාළ සංගම් සමඟ සබඳතා ඇති කර ගැනීමේදී තේ, මැණික් සහ අනෙකුත් කර්මාන්තවල ශ්‍රී ලාංකික ව්‍යවසායන්ට අඛණ්ඩව සහය වීමට, චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනය, චීන ආනයන හා අපනයන ප්‍රදර්ශනය, චීන-දකුණු ආසියානු ප්‍රදර්ශනය සහ ඊ-වාණිජ්‍ය වේදිකා වැනි ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වයට පහසුකම් සැලසීමට සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සහ දෙපාර්ශ්වයටම ඵලදායී ප්‍රතිඵල මත පදනම්ව දෙරටේ ව්‍යවසායන් අතර සහයෝගිතාව තවදුරටත් වැඩිදියුණු කිරීමට තමන් සූදානමින් සිටින බව චීනය ප්‍රකාශ කළේය. සමානාත්මතාව, අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සහ දෙපාර්ශ්වයටම ඵලදායී ප්‍රතිඵල යන මූලධර්මවලට අනුකූලව එක් සැලැස්මක් තුළ විස්තීර්ණ නිදහස් වෙළෙඳ ගිවිසුමක් ඉක්මනින් අවසන් කිරීම සඳහා කටයුතු කිරීමට දෙපාර්ශ්වය විය.

ශ්‍රී ලංකාව චීනයෙන් කෙරෙන තවත් ව්‍යාපාරික ආයෝජන සාදරයෙන් පිළිගන්නා අතර ඒ සඳහා හිතකර ආයෝජන සහ ව්‍යාපාරික පරිසරයක් සපයනු ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථික පරිවර්තනය සහ තිරසර සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමට චීන ව්‍යවසායන් දිරිමත් කිරීම චීනය අඛණ්ඩව කරගෙන යනු ඇත. ස්වකීය උසස් තත්ත්වයේ සහ

අන්යොන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් ප්‍රායෝගික සහයෝගිතාව ඉදිරියට ගෙන යාම සඳහා සැපයුම්, හරිත සංවර්ධන සහ ඩිජිටල් ආර්ථික වැනි ක්ෂේත්‍රවල සහයෝගිතාව පුළුල් කිරීමට දෙපාර්ශ්වය එකඟ විය.

10. කෘෂිකර්මාන්තය පිළිබඳව ඔවුන්ගේ පුළුල් පරාසයක පැතිරුණු සහයෝගීතාව සහ විස්තීර්ණ හුවමාරු පිළිබඳව දෙපාර්ශ්වය ධනාත්මක ඇගැයීම් හුවමාරු කර ගත්තේය. ශ්‍රී ලංකාවේ තිරසර කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ශක්‍යතා වැඩි දියුණු කිරීමට උපකාරී වන පරිදි නිවර්තන භෝග සඳහා ජෛව තාක්ෂණ ක්‍රම, ශාක අභිජනනය සහ වගාව, ජලජීවී වගාව ඇතුළු ක්ෂේත්‍රවල පුහුණු සහ නිරූපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තමන් සතු සූදානම චීනය ප්‍රකාශ කළේය. එමෙන්ම, තේ, පලතුරු, කුරුඳු සහ ජලජ නිෂ්පාදන ඇතුළු සුවිශේෂී නිෂ්පාදන චීනයට අපනයනය කිරීම තවදුරටත් පුළුල් කරන ලෙස චීනය ශ්‍රී ලංකාවට යෝජනා කළේය. දරිද්‍රතාව අවම කිරීම සහ ග්‍රාමීය පුනර්ජීවනය කෙරෙහි තියුණු අවධානයක් යොමු කරමින් හුවමාරු සහ සහයෝගීතාව පුළුල් කිරීමට ඇති තමන් තුළ ඇති සූදානම දෙපාර්ශ්වයම ඉදිරිපත් කළේය. කෘෂිකර්මාන්තයට අදාළ ක්ෂේත්‍රවල සේවකයින්ගේ ශක්‍යතා වර්ධනය කිරීමෙහිලා ශ්‍රී ලංකාවට සහය දැක්වීමට තමන් තුළ ඇති සූදානම චීනය ප්‍රකාශ කළේය.

11. දේශගුණික විපර්යාස මානව සමාජයේ විශාලතම අභියෝගයක් වන බවත් චීනය සහ ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවල තිරසර සංවර්ධනයට එය තර්ජනයක් වන බවත් දෙපාර්ශ්වයම පිළිගනියි. දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් ක්‍රියාකාරීව එක්ව කටයුතු කිරීමට ඔවුහු එකඟ වූහ. දරුණු ගංවතුර තත්ත්වය හමුවේ චීනය ලබා දුන් මානුෂීය සහන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව චීනයට කෘතඥතාව පළ කළේය. ආපදා වැළැක්වීම සහ අවම කිරීම මෙන්ම හදිසි ගලවා ගැනීම වැනි ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාව සමඟ සහයෝගීතාව වැඩි දියුණු කිරීමට, එහි තාක්ෂණයන් බෙදා ගැනීමට සහ ශ්‍රී ලංකාවේ හදිසි කළමනාකරණ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා පුහුණුව ලබා දීමට තමන් තුළ ඇති සූදානම චීනය ප්‍රකාශ කළේය. එක්සත් ජාතීන්ගේ 2030 තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ඒකාබද්ධ ප්‍රයත්නයේ කොටසක් ලෙස එක් තීරයක් එක් මාවතක් ජාත්‍යන්තර හරිත සංවර්ධන සන්ධානයේ සහ අනෙකුත් සංසදවල අදාළ ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය චීනය සාදරයෙන් පිළි ගනියි.

12. සමානාත්මතාව, අන්යොන්‍ය විශ්වාසය, විවෘතභාවය සහ අන්යොන්‍ය ප්‍රතිලාභ මත පදනම්ව සමුද්‍රීය සහයෝගීතාව අඛණ්ඩව පවත්වාගෙන යෑමට සහ සමුද්‍රීය කටයුතු සම්බන්ධයෙන් ක්‍රමික ද්විපාර්ශ්වික උපදේශන පැවැත්වීමට දෙපාර්ශ්වයම කැමැත්තක් දක්වයි. සමුද්‍රීය පරිසරය සහ පරිසර පද්ධති සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය, සමුද්‍රීය කලාප පිළිබඳ දැනුවත් භාවය, සමුද්‍රීය ගලවා ගැනීම හා ආපදා සහන, සහ සමුද්‍රීය ක්ෂේත්‍රය හා සම්බන්ධ පිරිස් වෙත පුහුණුව ලබා දීම හා ශක්‍යතා වර්ධනය වැනි ක්ෂේත්‍රවල සහයෝගීතාව වර්ධනය කිරීමට සහ පොදු අනාගතයක් සහිත සමුද්‍රීය ප්‍රජාවක් ගොඩනැගීම සඳහා සිය ශක්තිය ඒකරාශී කර ගැනීමට දෙපාර්ශ්වය සූදානමය. නීල හවුල්කාරිත්වය උදෙසා සාගර සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට දෙපාර්ශ්වය එකඟ විය.

13. අධ්‍යාපනය පිළිබඳ සහයෝගීතාව වර්ධනය කිරීමට දෙපාර්ශ්වයම සූදානමින් සිටියි. අවබෝධය සහ මිත්‍රත්වය වැඩි කිරීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ හුවමාරුවල වැදගත්කම සම්පූර්ණයෙන්ම හඳුනාගත් අතර, දෙපාර්ශ්වය, ගුරුවරුන්, සිසුන් සහ පර්යේෂකයින් හුවමාරු කර ගැනීම තවදුරටත් වැඩිදියුණු කිරීමට තමන් තුළ ඇති සූදානම ප්‍රකාශ කළේය. චීනය තුළ වැඩිදුර අධ්‍යාපනය හැදෑරීමට කැමැත්තක් දක්වන ශ්‍රී ලාංකික සිසුන්, චීනය විසින් තවදුරටත් දිරිමත් කරනු ලබන අතර ඔවුහු එරටට සතුටින් පිළිගනු ලැබෙති. එමෙන්ම චීන රජයේ ශිෂ්‍යත්ව ලබා දීමෙන් ඔවුන්ට අඛණ්ඩව සහය වීමට චීනය සූදානමින් සිටියි. ලුබාන් වැඩමුළුව ක්‍රියාත්මක කිරීම සඳහා චීනය ශ්‍රී ලංකාව සමඟ කටයුතු කරනු ඇති අතර වෘත්තීය හා තාක්ෂණික පුහුණුව ඔස්සේ ශ්‍රී ලංකාවේ තවත් වෘත්තිකයන් පෝෂණය කරනු ඇත. අධ්‍යාපනය සඳහා ලබා දෙන චීන සහය අගය කරන ශ්‍රී ලංකාව, චීනය සමඟ එක්ව ඩිජිටල් පන්ති කාමර ව්‍යාපෘතියේ සාර්ථකත්වය සඳහා කටයුතු කරනු ඇත. ශ්‍රී ලංකාවේ චීන භාෂා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකාවේ චීන සංස්කෘතික මධ්‍යස්ථානය හරහා දෙරට අතර සංස්කෘතික හුවමාරු සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමට දෙපාර්ශ්වයම සූදානමව සිටියි. චීන විද්‍යා ඇකඩමිය යටතේ ඇති චීන-ශ්‍රී ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ඒකාබද්ධ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සහ දෙරටේ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල විද්‍යාත්මක හා තාක්ෂණික හුවමාරු හා සහයෝගීතාව සහ අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා දෙපාර්ශ්වය අඛණ්ඩව කටයුතු කරනු ඇත.

14. දෙපාර්ශ්වයම ඔවුන්ගේ දිගුකාලීන මිත්‍රත්වය ඉදිරියට ගෙන යාමට සහ ඔවුන්ගේ ජනතාව සමීප කරවීමට සූදානමින් පසුවෙයි. දෙරට අතර සංචාර සහ ගුවන් සම්බන්ධතා දිරිගැන්වීම සඳහා දෙපාර්ශ්වය බහුවිධ පියවර ගනු ඇත. සේද මාවතේ නගර පිළිබඳ ජාත්‍යන්තර සංචාරක සන්ධානයට තවත් ශ්‍රී ලාංකික නගර එක් කරනු දකින්නට චීනය කැමැත්ත දක්වයි. චීනයේ සහ ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධන කටයුතු කිරීමේදී දෙපාර්ශ්වය එකිනෙකාට සහයෝගය දක්වනු ඇත.

15. බෞද්ධ ආගම හා බැඳුණු හුවමාරු මත ගොඩනැගී ඇති තාරුණ්‍යය, බුද්ධි මණ්ඩල, ක්‍රීඩා සහ ජනමාධ්‍ය ආදී ක්ෂේත්‍රවල හුවමාරු සහ සහයෝගීතාව ශක්තිමත් කිරීමට සහ පුද්ගල-පුද්ගල සබඳතා සහ සහෝදර නගර අතර පවතින සබඳතා ශක්තිමත් කිරීමට දෙපාර්ශ්වය සූදානමින් පසුවෙයි.

16. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශයේ සංවර්ධනය සඳහා චීනය දිගින් දිගටම සහයෝගය ලබා දෙනු ඇත. බ්‍රයිට්නස් ඇක්ෂන් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වෛද්‍ය කණ්ඩායම් ශ්‍රී ලංකාවට යැවීම චීනයේ යුනාන් පළාත අඛණ්ඩව කරගෙන යනු ඇත.

17. සංස්කෘතික උරුමයන් සංරක්ෂණය සඳහා වූ ආසියානු මුලපිරීම පිළිබඳ ජනාධිපති ෂී ජින්පිං මහතාගේ යෝජනාවට ශ්‍රී ලංකාව ලබා දුන් ධනාත්මක ප්‍රතිචාරයත් සහ ආසියාවේ සංස්කෘතික උරුමයන් සඳහා වූ සන්ධානයේ ශ්‍රී ලංකාවේ සහභාගීත්වයත් චීන පාර්ශ්වයේ පැසසුමට ලක් වේ. මෙම සන්ධානය යටතේ චීනය ශ්‍රී ලංකාව සමඟ ද්විපාර්ශ්වික සංස්කෘතික උරුම සහයෝගීතාව තවදුරටත් ප්‍රවර්ධනය කරනු ඇත.

18. අධිකරණ, නීතිය ක්‍රියාත්මක කිරීම සහ ආරක්ෂක සහයෝගීතාව ද්විපාර්ශ්වික සහයෝගීතාවේ වැදගත් අංගයක් ලෙස දෙපාර්ශ්වය පිළිගන්නා අතර, දුරකථන මාර්ග හරහා සිදු කෙරෙන වංචා සහ මාර්ගගත ක්‍රමය හරහා කෙරෙන සූදුව වැනි දේශසීමා හරහා කෙරෙන අපරාධ ඒකාබද්ධව මර්දනය කිරීමට දෙපාර්ශ්වයම සූදානම්ව සිටියි. ශ්‍රී ලංකාවේ අධිකරණ, නීතිය ක්‍රියාත්මක කිරීම සහ ආරක්ෂක ක්ෂේත්‍රවල ශක්‍යතා වර්ධනයට සහය වීමට සහ පොලිස් සැපයුම් සඳහා සහය ලබා දීමට චීනය උපරිමයෙන් කටයුතු කිරීමට සූදානම්ය.

19. මානව වර්ගයා සඳහා වූ බෙදා හදාගත් අනාගතයක් සහිත ප්‍රජාවක් සංවර්ධනය කිරීම විෂයෙහිත්, ජනාධිපති ෂී ජින්පින් මැතිතුමා විසින් යෝජනා කරනු ලැබ ඇති ගෝලීය සංවර්ධන මූලපිරීම, ගෝලීය ආරක්ෂක මූලපිරීම හා ගෝලීය ශිෂ්ටාචාර මූලපිරීම විෂයෙහිත් සහය වීමට හා ක්‍රියාකාරීව සහභාගීවීමට තමන් තුළ ඇති කැපවීම ශ්‍රී ලංකාව යළි තහවුරු කළේය. දෙවැනි ලෝක යුද්ධය අවසන් වී නොබෝ කලකින් පිහිටවනු ලැබූ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 80 වැනි සංවත්සරය 2025, එනම් මෙම වසරේදී සනිටුහන් වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය මධ්‍ය කොට ගත් ජාත්‍යන්තර ක්‍රමය, ජාත්‍යන්තර නීතිය මත පදනම් වූ ජාත්‍යන්තර සාමය සහ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ අරමුණු හා මූලධර්ම මත පදනම් වූ ජාත්‍යන්තර සබඳතා පාලනය කරන මූලික සම්මතයන් එක්ව ආරක්ෂා කිරීමට තමන් තුළ වූ කැපවීම දෙපාර්ශ්වය නැවත තහවුරු කළේය. සාමකාමී සහජීවනය පිළිබඳ මූලධර්ම පහට තරයේ අනුගතව සිටින දෙපාර්ශ්වයම, සමාන හා ක්‍රමවත් බහු ධ්‍රැවීය ලෝකයක් සහ විශ්වීය වශයෙන් ප්‍රයෝජනවත් සහ සියල්ලන් ඇතුළත් ආර්ථික ගෝලීයකරණය සඳහා එක්ව පෙනී සිටිමින් ලෝකයේ සියලුම රටවලට සාමය, ආරක්ෂාව, සමෘද්ධිය සහ ප්‍රගතිය සහිත දීප්තිමත් අනාගතයක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කරනු ඇත.

20. සංචාරය අතරතුරදී, කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය, ජීවනෝපාය සහය, ජනමාධ්‍ය සහ සෙසු ක්ෂේත්‍රවල සහයෝගිතා ලියකියැවිලිවලට දෙපාර්ශ්වය අත්සන් තැබීය.

21. තමාට සහ ශ්‍රී ලංකා දූත පිරිසට දැක්වූ උණුසුම් ආගන්තුක සත්කාරය සම්බන්ධයෙන් චීන රජයට සහ ජනතාවට සිය කෘතඥතාව පළ කළ ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙසට චීන නායකත්වයට ඇරයුම් කළේය. එම කාරුණික ආරාධනයට චීන නායකත්වය කෘතඥතාව පළ කළ අතර, ඒ සම්බන්ධයෙන් රාජ්‍යතාන්ත්‍රික මාර්ග හරහා සන්නිවේදනය පවත්වා ගැනීමට දෙපාර්ශ්වය එකඟ විය.

சீன மக்கள் குடியரசுக்கும் இலங்கை ஜனநாயக சோசலிச குடியரசுக்கும் இடையிலான கூட்டு அறிக்கை
பீஜிங், 2025 ஜனவரி 16

1. சீன மக்கள் குடியரசுத் தலைவர் மேதகு ஷீ ஜின்பிங்கின் அழைப்பின் பேரில், இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின் தலைவர் மேதகு அனுர குமார திசாநாயக்க, 2025, ஜனவரி 14 முதல் 17 வரையில் சீன மக்கள் குடியரசிற்கான உத்தியோக பூர்வ விஜயமொன்றை மேற்கொண்டுள்ளார்.

2. இவ்விஜயத்தின் போது, ஜனாதிபதி அனுர குமார திசாநாயக்க, ஜனாதிபதி ஷீ ஜின்பிங்குடன் பேச்சுவார்த்தை மேற்கொண்டதுடன், அரச சபைப் பிரதமர் மேதகு லீ சியாங் மற்றும் தேசிய மக்கள் காங்கிரஸின் நிலைக்குழுத் தலைவர் மேதகு ஜாஓ லெர்ஜி ஆகியோரைச் சந்தித்தார். ஒரு சுமூகமான மற்றும் நட்பு சூழ்நிலையில், இரு தரப்பினரும் பாரம்பரிய நட்பை மேலும் வலுப்படுத்துதல், சீனாவிற்கும் இலங்கைக்கும் இடையே உயர்தர பெல்ட் அண்ட் ரோட் ஒத்துழைப்பை மேம்படுத்துதல் (ஒரே எண்ணக்கருவுடனான ஒரே பாதை), பல்துறை நடைமுறை ஒத்துழைப்பை மேம்படுத்துதல் மற்றும் பரஸ்பர ஆர்வமுள்ள பிராந்திய மற்றும் சர்வதேச பிரச்சினைகள் குறித்து ஆழமான கருத்துப் பரிமாற்றங்களை மேற்கொண்டதுடன், அவை தொடர்பில் விரிவானதும் பொதுவானதுமான புரிதல்களை எட்டினர்.

3. வெவ்வேறு அளவிலான பரிமாணங்களைக் கொண்ட நாடுகளான சீனாவும் இலங்கையும் 68 ஆண்டுகால இராஜதந்திர உறவுகளில் தொடர்ந்து ஒருவரையொருவர் மதித்து, ஒருவரையொருவர் சமமாக நடத்தி, ஒருவருக்கொருவர் ஆதரவாக இருந்துள்ளதுடன், நட்புரீதியான தொடர்புகள் மற்றும் பரஸ்பர நன்மை பயக்கும் ஒத்துழைப்புக்கு ஒரு சிறந்த முன்மாதிரியாகத் திகழ்கின்றன என்னும் பெருமையை இருதரப்பினரும் பகிர்ந்துகொள்கின்றனர். இறப்பர்-அரிசி ஒப்பந்தத்தில் பொதிந்துள்ள, சுயாதீனத்துவம், தன்னிறைவு நிலை, கூட்டுணர்வு மற்றும் பரஸ்பர உதவி ஆகியவற்றின் உணர்வை முன்னெடுத்துச் செல்லவும், பரஸ்பர மரியாதை, பரஸ்பர நம்பிக்கை, பரஸ்பர ஆதரவு, இருதரப்பினதும் வெற்றிக்கான ஒத்துழைப்பு மற்றும் பொதுவான வளர்ச்சி ஆகிய கொள்கைகளைப் பின்பற்றவும், நேர்மையான பரஸ்பர உதவி மற்றும் என்றென்றும் நீடிக்கும் நட்பின் அடிப்படையில் சீன-இலங்கை மூலோபாய கூட்டுறவு கூட்டாண்மையை ஆழப்படுத்துவதில் உறுதியாக இருக்கவும், இரு நாடுகளுக்கும் மக்களுக்கும் அதிக நன்மைகளை பயக்கும் பகிரப்பட்ட எதிர்காலத்துடன் கூடிய சீன-இலங்கை சமூகத்தை கூட்டாகக் கட்டியெழுப்பவும் இரு தரப்பினரும் ஒப்புக்கொண்டனர்.

4. இருதரப்பு உறவுகள் தொடர்பில், இரு நாடுகளின் தலைவர்களினதும் வலுவான மூலோபாய வழிகாட்டுதலைப் பேணுவதற்கும், இரு அரசுகள், சட்டமன்ற அமைப்புகள் மற்றும் அரசியல் கட்சிகளுக்கு இடையேயான இருதரப்பு பரிமாற்றங்களை மேலும் வலுப்படுத்துவதற்கும், அரசியலில் பரஸ்பர நம்பிக்கையை வலுப்படுத்துவதற்கும், ஒருவருக்கொருவர் ஆட்சி மற்றும் அபிவிருத்திக்கான அனுபவத்தைப் பகிர்ந்து கொள்வதற்கும், அவற்றின்மூலம் கற்றுக்கொள்வதற்கும், சீன-இலங்கை உறவுகளை மேம்படுத்த அர்ப்பணிப்புடன் முயற்சிகளை மேற்கொள்வதற்கும் இரு தரப்பினரும் இணங்கினர்.

5. இரு தரப்பினரும், தமது முக்கிய நலன்கள் மற்றும் கவனம் செலுத்தவேண்டிய முக்கிய விடயங்கள் தொடர்பிலான பிரச்சினைகளில், தமது பரஸ்பர ஆதரவை மீண்டும் உறுதிப்படுத்தினர். ஐக்கிய நாடுகள் சபையின் பொதுச் சபைத் தீர்மானம் 2758 இன் அதிகாரத்தை இரு தரப்பினரும் மீண்டும் உறுதிப்படுத்தியதுடன், சீன மக்கள் குடியரசின் அரசானது, முழு சீனாவையும் பிரதிநிதித்துவப்படுத்தும் ஒரே சட்டப்பூர்வ அரசாங்கம் என்பதையும், தாய்வான் சீனப்பிரதேசத்தின் பிரிதத்தெடுக்க முடியாத பகுதியாகும்

என்பதையும் அங்கீகரித்து, ஒரே சீனா கொள்கைக்கான தனது, வலுவான உறுதிப்பாட்டை இலங்கை மீண்டும் உறுதிப்படுத்தியது. தேசிய மீள் ஒருங்கிணைப்பை அடைவதற்கான சீன அரசின் அனைத்து முயற்சிகளையும் இலங்கை உறுதியாக ஆதரிப்பதுடன், "சுயாதீன தாய்வான்" எண்ணக்கருவின் எவ்வித நிலையும் எதிர்த்து நிற்கிறது. சீனா தொடர்பிலான எந்தவொரு எதிர் மற்றும் பிரிவினைவாத நடவடிக்கைகளுக்கும் தனது பிரதேசத்தைப் பயன்படுத்த இலங்கை ஒருபோதும் அனுமதிக்காது என்றும், ஷிசாங் மற்றும் ஷின்ஜியாங் தொடர்பான பிரச்சினைகளில் சீனாவை உறுதியாக ஆதரிக்கும் என்றும் இலங்கை மீண்டும் வலியுறுத்தியது. தேசிய சுதந்திரம், இறையாண்மை மற்றும் பிராந்திய ஒருமைப்பாட்டைப் பாதுகாப்பதில் இலங்கையை தொடர்ந்து வலுவாக ஆதரிப்பதாகவும், அதன் தேசிய நிலவரங்களுக்கு ஏற்ற வளர்ச்சிப் பாதையை சுயாதீனமான தெரிவுகளில் இலங்கைக்கு மதிபளித்து, அவற்றுக்கு ஆதரிப்பதாகவும் சீனா மீண்டும் வலியுறுத்தியது. சுதந்திரமானதும் அமைதியானதும் வெளியுறவுக் கொள்கைக்கான அதன் உறுதிப்பாட்டை சீனத் தரப்பு மீண்டும் வலியுறுத்தியது. சுயாதீனமான அணிசேரா வெளியுறவுக் கொள்கைக்கான தனது உறுதிப்பாட்டை இலங்கை மீண்டும் வலியுறுத்தியது.

6. 2024 ஆம் ஆண்டு ஜனாதிபதித் தேர்தல் மற்றும் பாராளுமன்றத் தேர்தல்களை வெற்றிகரமாக நடத்தியமைக்காக இலங்கைக்கு சீனா வாழ்த்து தெரிவித்ததோடு, இலங்கையின் புதிய அரசாங்கம், இலங்கை மக்களை பொருளாதார மற்றும் சமூக மேம்பாடு, ஒற்றுமை, ஸ்திரத்தன்மை மற்றும் செழிப்பு ஆகியவற்றில் முன்னோக்கி அழைத்துச் சென்றமைக்காக தனது நல்வாழ்த்துக்களைத் தெரிவித்தது மட்டுமால்லாமல் இலங்கை அரசாங்கம் நாட்டின் நிலையான அபிவிருத்தியை மேம்படுத்துவதற்கு அயராது உழைக்கும் தருணத்தில், சீனா தனது தீவிர ஆதரவை வழங்கத் தயாராக உள்ளதாகத் தெரிவித்தது. புதிய சகாப்தத்தில் சீனாவின் குறிப்பிடத்தக்க சாதனைகளை இலங்கை பாராட்டியதுடன், அனைத்து வகையிலும் சிறந்து விளங்குகின்ற நவீன சோசலிச நாடொன்றைக் கட்டியெழுப்பவும், சீன நவீனமயமாக்கல் பாதையின் மூலமான சீன தேசத்தின் புத்துணர்ச்சியை மேம்படுத்தவும் சீனாவுக்கான தனது ஆதரவைத் தெரிவித்தது. சீர்திருத்தங்களை விரிவுபடுத்தவும், மேலும் ஆழப்படுத்தவும், உயர்தரத்திலான வெளிப்படைத்தன்மையை ஊக்குவிக்கவும், சீனாவின் உந்துதல் இலங்கையின் பொருளாதார அபிவிருத்திக்கு புதிய வாய்ப்புகளைக் கொண்டுவரும் என இலங்கை நம்புகிறது.

7. இரு நாடுகளின் தலைவர்களின் வழிகாட்டுதல் மற்றும் ஊக்குவித்தலின் கீழ், சீனாவும் இலங்கையும் பெல்ட் அண்ட் ரோட் ஒத்துழைப்பில் பலனுறுதிமிக்க பெறுபேறுகளை உருவாக்கியுள்ளன. இலங்கை, அதன் பொருளாதார மற்றும் சமூக அபிவிருத்தியிலும், தனது மக்களின் வாழ்வாதார மேம்பாட்டிலும் பெல்ட் அண்ட் ரோடு ஒத்துழைப்பின் முக்கிய பங்கைப் பாராட்டுகிறது. கொழும்பு துறைமுக நகரம் மற்றும் ஹம்பாந்தோட்டை துறைமுக ஒருங்கிணைந்த அபிவிருத்தி உள்ளிட்ட அனைத்து முக்கிய திட்டங்களுக்கும் முன்னுரிமை அளிக்கக்கூடிய செயற்பாட்டு நடவடிக்கைகளையும் முன்னெடுப்பதற்கும், பட்டுப்பாதைச் செயற்பாட்டுத்திட்டம் போன்ற தளங்களை முழுமையாகப் பயன்படுத்துவதற்கும், வாழ்வாதாரத்திற்கான நிகழ்ச்சித் திட்டங்களுக்கமைவாக ஒன்றாகத் திட்டமிடுதல், ஒன்றாகக் கட்டியெழுப்புதல் மற்றும் ஒன்றாக பயனடைதல், திறந்ததும், பசுமையானதும் மற்றும் அர்ப்பணிப்புமிக்கதுமான ஒத்துழைப்பு, உயர்தரத்திலான, மக்களை மையமாகக் கொண்ட மற்றும் வளங்குன்றாத நிலையான வளர்ச்சியுடன்கூடிய உயர்தர பெல்ட் அண்ட் ரோடு ஒத்துழைப்பை ஆதரிப்பதற்காக ஜனாதிபதி ஷி ஜின்பிங் அறிவித்த எட்டு முக்கிய படிகளைப் பின்பற்றுவதற்கும் இரு தரப்பினரும் இணங்கினர்.

சீனா-இலங்கை உயர்தர பெல்ட் அண்ட் ரோட் ஒத்துழைப்பை மேம்படுத்துவதற்கும், உயர் தர, வலுவான மீள்தன்மை மற்றும் அதிக நிலைத்தன்மையினூடான இருதரப்பினதும் வெற்றியை நோக்காகக் கொண்ட மேம்பாட்டிற்கான புதிய இடத்தை கூட்டாகத் திறப்பதற்கும், பெல்ட் அண்ட் ரோட் ஒத்துழைப்புத் திட்டத்தில் கைச்சாத்திடுவதில் இரு தரப்பினரும் மகிழ்ச்சியடைந்தனர்.

8. கடன் பிரச்சினையை திறம்பட கையாள்வதில் இலங்கைக்கு வலுவான ஆதரவாக விளங்கிய சீனா, கடன்களை மறுசீரமைப்பதில் வழங்கிய முக்கிய உதவி உட்பட, நிதிசார் நெருக்கடி மிகுந்த காலங்களில் சீனாவிடமிருந்து இலங்கை பெற்ற பெறுமதிமிக்க ஆதரவிற்கு இலங்கை தனது மனமார்ந்த பாராட்டுகளைத் தெரிவித்தது. இலங்கை, சீன நிதி நிறுவனங்களுடன் இணைந்து ஒப்புக் கொள்ளப்பட்டவாறு, கடன் மறுசீரமைப்பு திட்டத்தை விரைவில் செயற்படுத்துவதற்கான தனது விருப்பத்தை வெளிப்படுத்தியது. சர்வதேச நாணய நிதியத்தில் சீனா தொடர்ந்து நேர்மறையான பங்கை வகிப்பதுடன், இலங்கையின் நிதிச் சிக்கல்களைத் தணிக்கவும், கடன்படு நிலையில் நீடிப்புத்திறனைப் பேணவும் உதவும் வகையில், ஏனைய கடன் வழங்குநர்களுடன் நட்புரீதியான தொடர்பைப் பேணுகிறது. இலங்கை மத்திய வங்கியும், சீன மக்கள் வங்கியும் தங்கள் நாணய மாற்று ஒப்பந்தத்தை புதுப்பித்துள்ளதுடன், நிதிசார் ஒத்துழைப்பைத் தொடர்ந்து மேற்கொள்ளவுள்ளன.

9. பொருளாதாரம் மற்றும் வர்த்தகத்தில் இருதரப்பு ஒத்துழைப்பின் முன்னேற்றம் குறித்து, இரு தரப்பினரும் திருப்தி அடைந்துள்ளனர். பல்வேறு வழிகளில் இலங்கையிலிருந்தான, இறக்குமதியை ஊக்குவிப்பதற்காக சீனா மேற்கொண்டுள்ள முயற்சிக்கு இலங்கை தெரிவித்தது. தேயிலை, இரத்தினக்கல் மற்றும் பிற தொழில்களில் ஈடுபட்டுள்ள இலங்கை நிறுவனங்களுக்கு சீன இறக்குமதியாளர்கள் மற்றும் ஏற்றுமதியாளர்கள் சங்கங்களுடன் உறவுகளை ஏற்படுத்துவதில் தொடர்ந்து ஆதரவளிக்கவும், சீன சர்வதேச இறக்குமதி கண்காட்சி, சீன இறக்குமதி மற்றும் ஏற்றுமதிக் கண்காட்சி, சீன-தெற்காசிய கண்காட்சி மற்றும் இலத்திரனியல் வணிகத் தளங்கள் போன்றவற்றில் இலங்கை பங்கேற்பதை எளிதாக்கவும், பரஸ்பர நன்மை மற்றும் இருதராப்பினரதும் வெற்றிக்கான பெறுபேற்று அடிப்படையில் இரு நாடுகளின் நிறுவனங்களுக்கிடையேயான ஒத்துழைப்பை மேலும் மேம்படுத்தவும் சீனா தனது தயார்நிலையை வெளிப்படுத்தியது. சமத்துவம், பரஸ்பர நன்மை மற்றும் இருதரப்பினதும் வெற்றியை நோக்காகக்கொண்ட கொள்கைகளுக்கு இணங்க, சகலதும் அடங்கிய தொகுப்பொன்றில் விரிவான சுதந்திர வர்த்தக ஒப்பந்தத்தை முன்கூட்டியே முடிவுக்குக் கொண்டுவருவதற்கு இரு தரப்பினரும் ஒப்புக்கொண்டனர்.

இலங்கை சீனாவிலிருந்து அதிக வணிக முதலீட்டை வரவேற்பதுடன், இந்நோக்கத்திற்காக உகந்ததொரு முதலீடு மற்றும் வணிக சூழலை வழங்கும். இலங்கையில் பொருளாதார மாற்றம் மற்றும் நிலையான அபிவிருத்தியை எளிதாக்குவதற்காக இலங்கையில் முதலீடு செய்வதில், சீனாவானது அதன் நிறுவனங்களை தொடர்ந்து ஊக்குவிக்கும். உயர்தர மற்றும் பரஸ்பர நன்மை பயக்குகின்ற செயற்பாட்டு ரீதியிலான, ஒத்துழைப்பை மேம்படுத்துவதற்காக, ஏற்பாட்டியல், வளங்குன்றாத அபிவிருத்தி மற்றும் இலத்திரனியல் பொருளாதாரம் போன்ற துறைகளில் ஒத்துழைப்பை விரிவுபடுத்த இரு தரப்பினரும் இணங்கினர்.

10.விவசாயம் தொடர்பான பரந்த அளவிலான ஒத்துழைப்பு மற்றும் ஆழமான பரிமாற்றங்கள் குறித்த நேர்மறையான மதிப்பீடுகளை இரு தரப்பினரும் பகிர்ந்து கொண்டனர். இலங்கையின் நிலையானதும், வளங்குன்றாததுமான விவசாய

வளர்ச்சிக்கான திறனை மேம்படுத்த உதவும் வகையில் வெப்பமண்டல பயிர்களுக்கான உயிரியற் தொழில்நுட்பங்கள், தாவரப் பெருக்கம் பயிர்ச்செய்கை மற்றும் மீன்வளர்ப்பு உள்ளிட்ட துறைகளில் இலங்கையுடன் பயிற்சி மற்றும் செயல்விளக்கத் திட்டங்களை மேற்கொள்வதற்கான தனது தயார்நிலையை சீனா தெரிவித்தது; மேலும் தேயிலை, பழங்கள், இலவங்கப்பட்டை மற்றும் நீர்வள உற்பத்திப் பொருட்கள் உள்ளிட்ட தனித்துவமான பொருட்களை சீனாவிற்கு ஏற்றுமதி செய்வதை இலங்கை மேலும் விரிவுபடுத்துவதை வரவேற்றது. வறுமைக் குறைப்பு மற்றும் கிராமப்புற மறுமலர்ச்சியில் உன்னிப்பாகக் கவனம் செலுத்துவதன் மூலம் பரிமாற்றங்கள் மற்றும் ஒத்துழைப்பை விரிவுபடுத்துவதற்கான தயார்நிலையை இரு தரப்பினரும் பகிர்ந்து கொண்டனர். தொடர்புடைய துறைகளில் பணியாளர்களின் திறனை வலுப்படுத்த இலங்கைக்கு உதவ சீனா தனது தயார்நிலையை வெளிப்படுத்தியது.

11. இரு தரப்பினரும் காலநிலை மாற்றத்தை மனித சமூகத்தின் மிகப்பெரிய சவால்களில் ஒன்றாகவும், சீனா மற்றும் இலங்கை உள்ளிட்ட வளரும் நாடுகளின் நிலையான வளர்ச்சிக்கு அச்சுறுத்தலாகவும் விளங்குகின்றது என்பதை ஏற்றுக்கொண்டனர். காலநிலை மாற்றத்தில், தொடர்ந்தும் தீவிரமாக இணைந்து பணியாற்ற இணங்கினர். கடுமையான வெள்ளப்பெருக்கின்போதான, சீனாவின் மனிதாபிமான நிவாரணத்திற்காக இலங்கை நன்றி தெரிவித்தது. பேரிடர் தடுப்பு, அனர்த்தங்களுக்கெதிரான கட்டுப்பாட்டு நடவடிக்கைகள் மற்றும் அவசரகால மீட்பு போன்ற துறைகளில் இலங்கையுடன் ஒத்துழைப்பை மேம்படுத்தவும், அதன் தொழில்நுட்பங்களைப் பகிர்ந்து கொள்ளவும், இலங்கையின் அவசரகால முகாமைத்துவத் திறன்களை மேம்படுத்துவதில் பயிற்சி அளிக்கவும் சீனா தயாராக இருப்பதாகத் தெரிவித்தது. ஐக்கிய நாடுகளின் 2030 இற்கான நிலையான வளர்ச்சி இலக்குகளை அடைவதற்கான கூட்டு முயற்சியின், பகுதியொன்றாக, பெல்ட் அண்ட் ரோட் சர்வதேச வளங்குன்றாத நிலையான அபிவிருத்திக் கூட்டணி மற்றும் ஏனைய தளங்களின் தொடர்புடைய நடவடிக்கைகளில் இலங்கையின் பங்களிப்பை சீனா வரவேற்கிறது.

12.சமத்துவம், பரஸ்பர நம்பிக்கை, வெளிப்படைத்தன்மை மற்றும் பரஸ்பர நன்மை ஆகியவற்றின் அடிப்படையில் கடல்சார் ஒத்துழைப்பைத் தொடரவும், கடல்சார் விவகாரங்களில் தொடர்ந்து இருதரப்பு ஆலோசனைகளை நடத்தவும் இரு தரப்பினரும் விரும்புகின்றனர். கடல்சார் சுற்றுச்சூழல் மற்றும் கடல்சார் சுற்றுச்சூழல் அமைப்புகளைப் பாதுகாத்தல் மற்றும் மறுசீரமைத்தல், கடல்சார் கள விழிப்புணர்வு, கடல்சார் மீட்பு மற்றும் பேரிடர் நிவாரணம், கடல்சார் பணியாளர்களுக்கான பயிற்சி மற்றும் திறன் மேம்பாடு போன்ற துறைகளில் ஒத்துழைப்பை மேலும் விரிவுபடுத்தவும், பகிரப்பட்ட எதிர்காலத்துடன் கூடிய கடல்சார் சமூகத்தை உருவாக்க தங்கள் பலத்தை திரட்டவும் இரு தரப்பினரும் தயாராக உள்ளனர். நீல (கடல்சார்) கூட்டாண்மைக்கான கடல்சார் ஒத்துழைப்பு குறித்த புரிந்துணர்வு ஒப்பந்தத்தில் கைச்சாத்திட இரு தரப்பினரும் இணங்கினர்.

13. கல்வித்துறையில் ஒத்துழைப்பை மேம்படுத்த இரு தரப்பினரும் தயாராக உள்ளனர். புரிதல் மற்றும் நட்பை அதிகரிப்பதற்கு கல்வித்துறையிலான பரிமாற்றங்களின் முக்கியத்துவத்தை இரு தரப்பினரும் முழுமையாக அங்கீகரித்ததுடன், ஆசிரியர்கள், மாணவர்கள் மற்றும் ஆராய்ச்சியாளர்களின் பரிமாற்றங்களை மேலும் மேம்படுத்துவதற்கான தயார்நிலையை இருதரப்பினரும் வெளிப்படுத்தினர். மேலும் அர்ப்பணிப்புள்ள மாணவர்கள் சீனாவில் மேற்படிப்பைத் தொடர்வதனை சீனா வரவேற்று,

ஊக்குவிப்பதுடன், அவர்களுக்கு அரசாங்க புலமைப்பரிசில்களுடன்கூடிய ஆதரவை அளிக்கத் தயாராக உள்ளது. லூபன் செயற்பாட்டு அமர்வினூடே சிறப்பான பலனை அளிக்கவும், இலங்கைக்கு தொழிற்பயிற்சி மற்றும் தொழில்நுட்ப பயிற்சி மூலம் அதிகபடியான தொழில்வாண்மையாளர்களை வளர்க்கவும், சீனா இலங்கையுடன் இணைந்து செயற்படும். கல்வித்துறையில் சீனாவின் உதவியை இலங்கை பாராட்டுவதுடன், சீனாவுடன் இணைந்து டிஜிட்டல் வகுப்பறை செயற்திட்டத்தின் வெற்றிக்காகச் செயற்படும். இலங்கையில் சீன மொழிக் கல்வியை ஊக்குவிக்கவும், இலங்கையில் உள்ள சீன கலாச்சார மையத்தின் மூலம் இரு நாடுகளுக்கும் இடையே கலாச்சார பரிமாற்றங்கள் மற்றும் ஒத்துழைப்பை மேம்படுத்தவும் இரு தரப்பினரும் தயார்நிலையில் உள்ளனர். சீன அறிவியல் கல்வி நிறுவனத்தின் கீழுள்ள, சீன-இலங்கை கூட்டு கல்வி மற்றும் ஆராய்ச்சி மையத்தில் இரு தரப்பினரும் தொடர்ந்து பணியாற்றுவது மட்டுமின்றி, அதனை மேம்படுத்துவதுடன், இரு நாடுகளின் பல்கலைக்கழகங்கள் மற்றும் ஆராய்ச்சி நிறுவனங்களில் அறிவியல் மற்றும் தொழில்நுட்ப பரிமாற்றங்கள், ஒத்துழைப்பு மற்றும் கல்வித்துறையை வலுப்படுத்துவதில் ஈடுபாட்டுடன் செயற்படுவர்.

14. இரு தரப்பும் தமது, நீண்டகால நட்பை முன்னெடுத்துச் செல்லவும், தங்கள் மக்களை நெருக்கமாகக் கொண்டுவரவும் தயாராக உள்ளனர். பரஸ்பர சுற்றுலா மற்றும் விமானமார்க்க தொடர்புகளை ஊக்குவிக்க இரு தரப்பினரும் பல்வேறு நடவடிக்கைகளை மேற்கொள்ளவுள்ளனர். பட்டுப்பாதை நகரங்களின் சர்வதேச சுற்றுலா கூட்டணியில் இணைத்துள்ள இலங்கை நகரங்களை சீனா வரவேற்கிறது. சீனா மற்றும் இலங்கையில் சுற்றுலா மேம்பாட்டு நடவடிக்கைகளை மேற்கொள்வதில் இரு தரப்பினரும் தொடர்ந்து ஒருவருக்கொருவர் ஆதரவளிப்பர்.

15. இளைஞர்கள், சிந்தனையாளர்கள், விளையாட்டு மற்றும் ஊடகங்கள் போன்ற துறைகளில் பரிமாற்றங்கள் மற்றும் ஒத்துழைப்பை வலுப்படுத்தவும், புத்தமதப் பரிமாற்றங்களின் பிணைப்பைக் கட்டமைக்கவும், மக்களிடையேயும் சகோதர நகரங்களுக்கிடையிலான பரிமாற்றங்களை ஆழப்படுத்தவும் இரு தரப்பினரும் தயாராக உள்ளனர்.

16. இலங்கையில் சுகாதாரத் துறையின் வளர்ச்சிக்கு சீனா தொடர்ந்து ஆதரவளிக்கும். சீனாவின் யூனான் மாகாணம், ப்ரைட்னஸ் ஆக்ஷன் திட்டத்தை செயல்படுத்த இலங்கைக்கு மருத்துவக் குழுக்களை தொடர்ந்து அனுப்பும்.

17. ஜனாதிபதி ஷி ஜின்பிங்கின் கலாச்சார பாரம்பரியப் பாதுகாப்புக்கான ஆசிய முன்முயற்சி மற்றும் ஆசியாவில் கலாச்சார பாரம்பரியத்திற்கான கூட்டணி போன்றவற்றில் பங்கேற்பதற்கான இலங்கையின் நேர்மறையான பதிலை சீனத் தரப்பு பாராட்டுகிறது. இக்கூட்டணியின் கீழ் இலங்கையுடன் இருதரப்பு கலாச்சார பாரம்பரிய ஒத்துழைப்பை சீனா மென்மேலும் ஊக்குவிக்கும்.

18. நீதித்துறை, சட்ட அமுலாக்கம் மற்றும் பாதுகாப்பு ஒத்துழைப்பு ஆகியவை இருதரப்பு ஒத்துழைப்பின் ஒரு முக்கிய அங்கம் என்பதனை இரு தரப்பினரும் ஏற்றுக்கொள்வதுடன், தொலைத்தொடர்பு மோசடிகள் மற்றும் இணையத்தள சூதாட்டம் போன்ற நாடுகள் கடந்த குற்றங்களை கூட்டாகக் கட்டுப்படுத்தத் தயாராக உள்ளனர். இலங்கையின் நீதித்துறை, சட்ட அமுலாக்கம் மற்றும் பாதுகாப்புத் துறைகளில் திறன் மேம்பாட்டை ஆதரிக்கவும், காவல் துறைக்கு உதவி வழங்கவும் சீனா தன்னால் இயலுமான அனைத்தையும் செய்யத் தயாராகவுள்ளது.

19.ஜனாதிபதி ஷீ ஜின்பிங் முன்மொழிந்த உலகளாவிய அபிவிருத்திக்கான முயற்சி, உலகளாவிய பாதுகாப்பு முயற்சி மற்றும் உலகளாவிய நாகரிக முயற்சி ஆகிய மனிதகுலத்திற்கான பகிரப்பட்ட எதிர்காலத்தைக் கொண்ட ஒரு சமூகத்தின் வளர்ச்சியை ஆதரிப்பதற்கும், அவ்வளர்ச்சியில் தீவிரமாக பங்கேற்பதற்கும் இலங்கை தனது உறுதிப்பாட்டை மீண்டும் வலியுறுத்தியது. இரண்டாம் உலகப் போர் முடிவடைந்த காலகட்டத்தில் நிறுவப்பட்ட ஐக்கிய நாடுகள் சபையானது, 2025 ஆகிய இவ்வாண்டில், தனது 80 வது ஆண்டு நிறைவைக் குறித்து நிற்கிறது. ஐக்கிய நாடுகள் சபையை மையமாகக் கொண்ட சர்வதேச முறைமை, சர்வதேச சட்டத்தால் ஆதரிக்கப்படும் சர்வதேச ஒழுங்கு மற்றும் ஐக்கிய நாடுகள் சாசனத்தின் நோக்கங்கள் மற்றும் கொள்கைகளின் அடிப்படையில் சர்வதேச உறவுகளை நிர்வகிக்கும் அடிப்படை விதிமுறைகளுகிணங்க சர்வதேச முறைமையொன்றை நிலைநிறுத்துவதற்கான தனது இணைந்த உறுதிப்பாட்டை இரு தரப்பினரும் மீண்டும் உறுதிப்படுத்தினர். இரு தரப்பினரும் அமைதியான சகவாழ்விற்கான ஐந்து கொள்கைகளை கடைபிடிப்பதுடன், சமமான மற்றும் சீரான பன்முக உலகம் மற்றும் உலகளாவிய அடிப்படையில் நன்மை பயக்கும் மற்றும் அனைத்தும் உள்ளடங்கலான பொருளாதார உலகமயமாக்கலை கூட்டாக ஆதரிப்பது மட்டுமின்றி, உலகின் அனைத்து நாடுகளுக்கும் அமைதி, பாதுகாப்பு, செழுமை மற்றும் முன்னேற்றத்துடனான பிரகாசமான எதிர்காலத்தை நோக்கிச் செயற்படுவர்.

20.இவ்விஜயத்தின் போது, விவசாயம், சுற்றுலா, வாழ்வாதார உதவி, ஊடகம் மற்றும் ஏனைய துறைகளில் இரு தரப்பினரும் ஒத்துழைப்பு ஆவணங்களில் கைச்சாத்திட்டனர்.

21.ஜனாதிபதி அனுர குமார திஸாநாயக்க, தனக்கும் இலங்கை தூதுக்குழுவிற்கும் வழங்கப்பட்ட அன்பான விருந்தோம்பலுக்காக சீன அரசாங்கத்திற்கும் மக்களுக்கும் நன்றி தெரிவித்ததுடன், சீனத் தலைமையை இலங்கைக்கு வருகை தருமாறு அழைப்பு விடுத்தார். சீன ஜனாதிபதி, இலங்கை ஜனாதிபதி விடுத்த அன்பான அழைப்பிற்கு நன்றி தெரிவித்ததைத்தொடர்ந்து, இரு தரப்பினரும் இராஜதந்திர ரீதியில் சிறப்பான தொடர்புகளைத் தொடர்ந்தும் சிறப்பாகப் பேண இணங்கினர்.

Copyright © 2022. Ministry of Foreign Affairs. All Rights Reserved. Developed by Theekshana R&D